මාධ්‍ය නිවේදනය
කොළඹ, 2017 ජූනි 06

Nestlé
Good Food, Good Life

# නෙස්ලේ තවදුරටත් 20,000කට අධික ග්‍රාමීය කිරි ගොවීන්ගේ ජීවනෝපාය නගාසිටුවීමට කටයුතු කරයි.

- සීප්පුකුලම කිරි ශීතාගාරය සමඟ ලෝක කිරි දිනය සැමරේ

උතුරු මැද පළාතට අයත් සීප්පුකුලම ගම්මානයේ කිරි ගොවීන් වෙත ප්‍රතිලාභ සලසමින් කිරි ශීතාගාරයක් වැඩි දියුණු කිරීමට නෙස්ලේ සමාගම පසුගියදා කටයුතු කළේය. මේ සමඟින් නෙස්ලේ සමාගම වෙත තම කිරි වැඩි වශයෙන් අලෙවි කිරීමේ අවස්ථාව එම ප්‍රදේශයේ කිරි ගොවීන්ට උදාවිය. මෙරට පෞද්ගලික අංශයේ විශාලතම කිරි මිල දී ගන්නා වන්නේ නෙස්ලේ සමාගමයි. ගෙවුණු වසර තුනක කාලය තුළ පමණක් කිරි මිලදීගැනීම හරහා රුපියල් බිලියන 10.5කට අධික මුදලක් සමාගම විසින් කිරි ගොවීන් වෙත ගෙවීම් ලෙස ලබා දී ඇත.

ලෝක කිරි දිනයට සමගාමීව මෙම වැඩිදියුණු කළ නව කිරි ශීතාගාරය විවෘත කෙරුණේ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍ය පී. හැරිසන් මහතාගේ ප්‍රධානත්වයෙනි. එහි වැඩි දියුණු කල ශීතාගාර සහ ගබඩා පහසුකම් හරහා 300කට ආසන්න කිරි ගොවීන් ප්‍රමාණයකට ප්‍රතිලාභ සැලසේ. වැඩි කිරි ප්‍රමාණයක් අලෙවි කිරීමට සහ, සමාගමේ පුළුල් පරාසයක පැතිරුණු කිරි ආශ්‍රිත නිෂ්පාදන නිපදවීම සඳහා කුරුණෑගල පිහිටි නෙස්ලේ සමාගමේ නිෂ්පාදනාගාරය වෙත ගෙන යන තෙක් කිරි නැවුම්ව තබා ගැනීමට මේ හරහා අවස්ථාව ලැබේ.

එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකාර්ම සංවිධානය විසින් නම් කරන ලද ලෝක කිරි දිනයේ පරමාර්ථය වන්නේ, ගෝලීය ආහාරයක් වශයෙන් කිරි වල වැදගත්කම හඳුනාගැනීම යි.

"කිරි ආහාර, හොඳ සෞඛ්‍යමත් ජීවිතයකට අත්‍යවශ්‍ය සාධකයක් ලෙස පිළිගැනෙනවා. නමුත් අද පාරිභෝගිකයන්ගේ කිරි අවශ්‍යතාවය සපුරාලීමට ප්‍රමාණවත් කිරි සැපයුමක් ඇත්තේ නැහැ. කිරි කර්මාන්තය වර්ධනය කිරීම සඳහා අපට විශාල හැකියාවක් තියෙන අතර, පසුගිය අවුරුදු කිහිපය මුළුල්ලේදී ශ්‍රී ලංකාව දේශීය කිරි වලින් ස්වයංපෝෂිත කිරීමට අපි වෙහෙස වී කටයුතු කළා. එහිදී කිරි ගොවීන්ගේ පුහුණු සහ සංවර්ධන කටයුතු වෙනුවෙන් සහ ඔවුන්ගෙන් ලබාගන්නා කිරි වෙනුවෙන් රුපියල් බිලියන ගණනක් වාර්ෂිකව ආයෝජනය කරන නෙස්ලේ සමාගම, මේ උත්සාහයන්හිදී පෞද්ගලික අංශය නියෝජනය කරමින් අපට සිටින පැරණිතම සහකරුවා වෙනවා. නෙස්ලේ ආයතනය විසින් තමන්ගේ නිෂ්පාදන කටයුතු සඳහා දේශීය කිරි භාවිතා කිරීමට දරන කැපවීම මම පෞද්ගලිකව දැක තිබෙනවා. ඉදිරියේදීත් අපේ රටේ කිරි කර්මාන්තයේ වගේම දේශීය ප්‍රජාවගේ අභිවෘද්ධියටත් නෙස්ලේ ආයතනයේ සහය අපට ලැබෙනු ඇතැයි මම බලාපොරොත්තු වෙනවා" යනුවෙන් අමාත්‍ය පී. හැරිසන් මහතා සඳහන් කළේය.

1980 දශකයේ මුල් භාගයේ පටන් මෙරට දේශීය බලධාරීන් හා සමීපව කටයුතු කරන නෙස්ලේ සමාගම, කිරි කර්මාන්ත අංශය තුළ යටිතල පහසුකම් සංවර්ධනය, කිරි ගොවි පුහුණුව හා සම්පත් ලබාදීම, පශු වෛද්‍ය සේවා, ක්ෂුද්‍ර මූල්‍ය ණය සේවා හා නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම ආදිය වෙනුවෙන් වාර්ෂිකව විශාල ලෙස ආයෝජනය කර තිබේ. ඉකුත් වසරේදී 'නෙස්ලේ කිරි ගොවි දිරිය' වැඩසටහනත් සමඟ නෙස්ලේ සමාගම, දේශීය කිරි ගොවීන්ගේ සංවර්ධනය සඳහා වූ තම කැපවීම නැවත වරක් සහතික කළේය. එම වැඩසටහන යටතේ 3,000කට වැඩි කිරි ගොවීන් සංඛ්‍යාවකට නවීන තාක්ෂණය හා භාවිතාවන් පිළිබඳ පුහුණුවක් ද පිරිනැමිණ.

නෙස්ලේ සමාගමේ අරමුණ වී ඇත්තේ කිරි සැපයුම ඉහළ නැංවීම හා දේශීය කිරි ගොවීන්ගේ ජීවනෝපාය තිරසාර ලෙස නගාසිටුවීම පමණක් නොව, කිරි පරිභෝජනය වැඩිකිරීම සඳහා වන සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැඩපිළිවෙලට ද සහාය ලබා දීම ය.

මේ පිළිබඳ අදහස් පළකරමින් නෙස්ලේ ලංකා සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂිකා ශිවානි හෙග්ඩේ මහත්මිය මෙසේ පැවසුවාය. "නෙස්ලේ නිෂ්පාදනවල ප්‍රධානතම කාරණා වන්නේ පෝෂණය හා යහගුණය යි. එහිදී අපි එක්රැස් කරගන්නා කිරිවලට හිමිවන්නේ වැදගත් තැනක්. ස්වභාවයෙන්ම කැල්සියම්වලින් පරිපූර්ණ කිරි, ක්ෂුද්‍ර පෝෂ්‍ය කොටස් ප්‍රවාහනයටද හොඳ මාධ්‍යයකි. ඒ හරහා දීර්ඝකාලීනව ජනගහනයේ විශාල පිරිසකගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීමට කිරිවලට හැකියාව තිබෙනවා. කිරි ගොවීන්ට තමන්ගේ කිරි සැපයුම ඉහළ නැංවීම සඳහා අපි ලබාදෙන දායකත්වයෙන් අපි ග්‍රාමීය ජීවිත සවිබල ගන්වනවා පමණක් නොව, රටේ ජනතාවට පෝෂණීය බවෙන් ඉහළ, රසවත් කිරි නිෂ්පාදන හා කිරි ආහාර මගින් කිරි පරිභෝජනය වැඩි කිරීමට ද අවස්ථාව ලබා දෙනවා".

නෙස්ප්‍රේ එව්රිඩේ, නෙස්ප්‍රේ ෆෝටිග්‍රෝ, නෙස්ප්‍රේ න්‍යුට්‍රි-අප් (Ready-To-Drink) හා මයිලෝ (Ready-To-Drink) වැනි නෙස්ලේ සමාගමේ කිරි ආශ්‍රිත නිෂ්පාදන, පාරිභෝගිකයන්ට අවශ්‍ය රසයත් පෝෂණ සංඝටකත් ලබාදීමට විශේෂයෙන්ම නිපදවා ඇත. දේශීය පෝෂණ ඌනතාවලට සරිලන පරිදි මෙම නිෂ්පාදනවල යකඩ, විටමින් A සහ වෙනත් ක්ෂුද්‍ර පෝෂණ සංඝටක ද අඩංගු වේ. එමෙන්ම අඩු ආදායම්ලාභී ජනතාව වෙත එම නිෂ්පාදන පරිභෝජනය කිරීමේ අවස්ථාව සලසමින් ඒවා දැරිය හැකි මිලකට වෙළෙඳපොළට හඳුන්වාදීමට ද නෙස්ලේ සමාගම කටයුතු කර තිබේ. මිල්ක්මේඩ්, නෙස්ටමෝල්ට් (Ready-To-Drink), නෙස්කැෆේ (Ready-To-Drink) වැනි සෙසු නෙස්ලේ නිෂ්පාදන ද දේශීය කිරි පරිභෝජනය ඉහළ නැංවීම සඳහා දායක වේ.

මෙසේ ග්‍රාමීය ජනතාවගේ ජීවනෝපාය වැඩි දියුණු කිරීමටත්, සවිමත් ශක්තිමත් ප්‍රජාවක් ගොඩ නැඟීමටත්, නෙස්ලේ සමාගම දරන කැපවීම තුළින් සමාගමේ ප්‍රධාන අරමුණ වන ජීවිතයේ ගුණාත්මකබව වැඩිදියුණු කිරීම හා සෞඛ්‍යමත් අනාගතයකට දායකවීම යන කාරණයද ඉටු වේ.